# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

### මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා
### (නව නිර්දේශය)

### ව්‍යවහාරික ඡායාරූප ශිල්පය හා වීඩියෝ ශිල්පය IMAT 28214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

1. චිත්‍රාගාර ඡායාරූපකරණය හා එළිමහන් ඡායාරූපකරණය (Studio Photography and Outdoor Photography) අතර පවතින සම විෂමතා සංසන්දනය කරන්න.

2. වෘත්තීය ඡායාරූප ශිල්පියා යනු කවරෙක් දැයි හඳුන්වා ඔහු ආධුනික ඡායාරූප ශිල්පියෙකුගෙන් වෙනස් වන ආකාරය විස්තර කරන්න.

3. "ඩිජිටල් තාක්ෂණයේ ආගමනය හේතුවෙන් වෘත්තිකයන්ට පමණක් සීමා වී තිබූ ඡායාරූප ශිල්පය වර්තමානය වන විට බහුල භාවිතයක් බවට පත්ව ඇත." අදහස් දක්වන්න.

4. මංගල ඡායාරූපකරණය නූතන ලාංකේය සමාජය තුළ ස්ථාපිත වී ඇති ආකාරය විමර්ශනය කොට, වෘත්තීය මංගල ඡායාරූප ශිල්පියෙකු විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම මාලාවක් සකස් කරන්න.

5. Photoshop මෘදුකාංගය ඡායාරූප ශිල්පයේ පසු නිෂ්පාදන ක්‍රියාවලියට සහ නිර්මාණශීලීත්වයට සිදුකරන බලපෑම සාකච්ඡා කරන්න.

6. ඡායාරූප ශිල්පයේ භාවිත වන නූතන උපකරණ හා මෙවලම් කිහිපයක් ලැයිස්තු ගත කර ඒවායේ භාවිතය සහ ප්‍රයෝජන විස්තර කරන්න.

7. අධිගතික පාරස ඡායාරූපකරණය (HDR) යනු කුමක්දැයි හඳුන්වා එවැනි ශිල්ප ක්‍රමයක් භාවිත කිරීමේ අවශ්‍යතාව නිදර්ශන සහිතව විස්තර කරන්න.

8. සොබාදම් සහ වනජීවී ඡායාරූපකරණය පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් නිර්වචනය පදනම් කරගෙන එහි සීමාවන් සහ සුවිශේෂ ලක්ෂණ විමසන්න.

9. වීඩියෝකරණයේදී යොදා ගනු ලබන කෝණ (Angles) සහ රූප වර්ග (Shots) හඳුන්වා දී ඒවා භාවිත කරනු ලබන ආකාරය රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිළි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.
    i. ළමා ඡායාරූපකරණය (Child Photography)
    ii. ක්‍රීඩා ඡායාරූපකරණය (Sport Photography)
    iii. භූමි දර්ශන ඡායාරූපකරණය (Landscape Photography)
    iv. Photoshoping
    v. Camera Gear
    vi. වීඩියෝ කැමරා වර්ග (Type of Video Camera)

*******************************